# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1784/22 - 2012 නොවැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2012.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වන වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති ඉඩම් කොටස්, නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වහා අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

කොළඹ දී ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, කොටුව ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත හා ලේඩන් බැස්ටියන් පාරේ පිහිටි, බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු සී. එම්. තාජුදීන් මහතා විසින් මැන පිළියෙල කරන ලද 1990.03.09 දිනැති අංක 31/90 දරන සැලැස්මේ කැබලි අංක 1 හා 2 වශයෙන් පෙන්වා ඇති වරිපනම් අංක 36, 40, 50, 81, 91, 95, 107, 115, 99 1/1, 99 1/3, 99 1/4, 99 1/5, 99 1/6, 99 1/10, 99 1/12, 99 1/15, 99 1/16, 99 1/17, 99 1/18, 99 1/20, 99 1/22, 99 1/23, 99 1/30, 99 1/32, 99 1/34, 99 1/36, 99 2/1, 99 2/4, 99 2/6, 99 2/8, 99 2/12, 99 2/14, 99 2/18, 99 2/24, 99 2/26, 99 2/30, 99 2/32, 99 2/34, 99 2/36, 99 2/38, 99 2/42, 99 2/48, 99 2/54, 99 2/56, 99 2/63, 99 2/66, 99 2/70, 99 3/1, 99 3/7, 99 3/12, 99 3/20 සහ 99 3/25 ලෙස දැක්වෙන අක්කර 0 රූඩ්. 02 පර්. 36.72 (හෙක්. 0.2953) ක ප්‍රමාණයෙන් යුක්ත වන්නා වූ පහත විස්තර කරන ගෘහ ගොඩනැගිල්ල සහිත ඉඩම් කැබලි දෙක (02)


1A - G 016886 — 340 (2012/11)

එකී ඉඩම් කැබලි වල මායිම් උපලේඛනය පහත දැක්වේ :

**කැබලි අංක 01**

| | | |
|---|---|---|
| උතුරට | - | ලේඩන් බැස්ටියන් පාර ; |
| නැගෙනහිරට | - | ලේඩන් බැස්ටියන් පාර සහ ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත මංසන්ධිය ; |
| දකුණට | - | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත ; |
| බටහිරට | - | කැබලි අංක 02. |
| ප්‍රමාණය | - | අක්කර 0, රූඩ් 02, පර්චස් 0.42 (හෙක්. 0.2035) |

**කැබලි අංක 02**

| | | |
|---|---|---|
| උතුරට | - | ලේඩන් බැස්ටියන් පාර ; |
| නැගෙනහිරට | - | කැබලි අංක 01 ; |
| දකුණට | - | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත ; |
| බටහිරට | - | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ වරිපනම් අංක 63 දරන ඖෂධ නීතිගත සංස්ථාව ; |
| ප්‍රමාණය | - | අක්කර 0, රූඩ් 0, පර්චස් 36.30 (හෙක්. 0.0918) |

11 - 1107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.